**#mediaethicsSL #SinhalaPress #lka #Mawbima**

ලිංගික අපරාධයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පුවත්පත් මගින් යොදාගන්නා "දූෂණය", "කෙළෙසීම" වැනි වදන් මගින් ලිංගික අපරාධයට ගොදුරු වූ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් හැඟවෙන බැවින්, එම වචන වෙනුවට "ලිංගික අපරාධය" යන වචනය යොදාගැනීම වඩාත් යෝග්‍ය බව අප විසින් නැවත නැවත පෙන්වා දී ඇත්තෙමු.

එසේම පුවත්පත් මගින් ලිංගික අපරාධයන් සම්බන්ධ වාර්තාවන්හිදී යොදාගන්නා තවත් යෙදුමක් වන්නේ "වැනසීම" යන්නයි. මෙම වැනසීම යන පදය ඔස්සේද ලිංගික අපරාධයකට ගොදුරු වූ වින්දිතයා විනාශ වී ඇති බව හැඟවෙන අතර, ඒ ඔස්සේ වින්දිතයාගේ අනාගතය අවසන් බවක්, වින්දිතයාගේ ජීවිතයම විනාශ වී ඇති බවක් ගම්‍ය නොවන්නේද යන්න සැබවින්ම සාකච්ඡාවට බඳුන් කළ යුතු කරුණකි.

මෙවන් යෙදුම් සම්බන්ධයෙන් බොහෝ දෙනෙකු එතරම් දුර දිග නොසිතුවත්, අපරාධකරු විසින් කරන ලද අපරාධයේ බරපතලකම විස්තීර්ණව දැක්වීම උදෙසා මෙවන් භාවාත්මක යෙදුම් යොදාගත්තත්, ඒ ඔස්සේ වක්‍රාකාරයෙන් වින්දිතයා වෙත සිදුවන බලපෑමද අප විසින් සලකා බැලිය යුතු වේ. ඒ නයින් ගත් විට "වැනසීම" වැනි වදන් වෙනුවටද "ලිංගික අපරාධයකට ලක් වීම" යනුවෙන්ම යෙදීම වඩාත් යෝග්‍ය නොවන්නේද?